## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2019

2023 ජූනි

### මානවශාස්ත්‍ර පීඨය

## සිංහල

### නූතන සිංහල සාහිත්‍ය ප්‍රවේශය- SINH 18214

පළමුවන කොටසේ ප්‍රශ්නයත් දෙවන හා තුන්වන කොටස්වලින් ප්‍රශ්න දෙක බැගිනුත් තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

---

### <u>1 කොටස</u>

01. පහත සඳහන් පද්‍ය නිර්මාණය පිළිබඳ විචාරයක් කරන්න.

| | |
|---|---|
| නැගිටින්න මගෙ පුතුනි දැනුදු නුඹ | ප්‍රමාදය |
| නැසේ ද කාකයන් නගන රැදු | විලාපය |
| දවසක් ම නසාලයි පමාවන | විනාඩිය |
| අහිමි වෙයි හෙට දිනට හිමි අහර | සලාකය |
| | |
| නුඹ නැතිව රේල්ලුව හඬ හඬා | දුවාවිය |
| එය අපේ පැල උඩින් ගියා සේ | දැනේවිය |
| රේල්ලුවෙ අඟුරු දුම මිසක මුළු | දිවා රැය |
| නො පෙනේවි පැල උඩින් බත් ඉදෙන | දුමාරය |
| | |
| පවුලෙ වැඩිමලා නුඹ හිසට මිණි | කිරුළක් ය |
| සහෝදරයන් කිම් ද නංගිලා | තිදෙනෙක් ය |
| සැඬ කුණාටුවක් මැද මුහුදු යන | ඔරුවක් ය |
| පුත හබල තිබෙන්නේ නුඹෙ අතේ | පමණක් ය |
| | |
| තමන් හිස තිබුණු බර මුදා විසුරුවා | හැර |
| නැන්දලා දීග දී උන්ට දිවි දොරටු | හැර |
| නුඹේ පියා එදා මා කැඳෙව්වේ ඔහු | වෙතට |
| ජීවිතේ සැන්දෑව පේන තෙක් | මානයට |
| | |
| ඉතින් පුත සටන් බිම් නො වැදුණොත් | කල් ඇතිව |
| නුඹ නසා දමනු ඇත කාලයේ | කුණාටුව |
| එයින් මතු එම දුකම ජන්ම දායාද | කොට |
| නුඹෙ පුතු ද දකිනු ඇත ජීවිතේ | අගාධය |
| | |
| නුඹෙ මුවින් නොගැයුණත් ජීවිතේ තුටු | ගීය |
| පුතුට එය ගයන්නට අවකාශය දිය | යුතුය |
| ළඟ නො වෙයි දුර බලව මගෙ පුත් | කුමාරය |
| නැගිටින්න නැගිටින්න දැනුදු නුඹ | ප්‍රමාදය |

## II කොටස

02. "හොඳ නවකතාවක පදනම නම් චරිත නිරූපණය මිස අනෙකක් නොවේ." තත් විචාරක මතයෙහි යුක්තියුක්තතාව විභාග කරන්න.

03. චරිත තුනක් නවකතාවෙහි සාර්ථකත්වයට හේතු වූ සාධක කවරේදැයි නිදර්ශනාත්මකව පහදන්න.

04. කෙටිකතා කලාව අරභයා ඉදිරිපත් ව ඇති අර්ථ නිරූපණ කවරේදැයි සමාලෝචනය කරන්න.

නැතහොත්

පරිසර වර්ණනා ආශ්‍රයෙන් චරිතයන්හි සංකීර්ණ මනෝභාව සූචනයෙහි ලා සිංහල කෙටිකතා රචකයන් දක්වන සාමර්ථ්‍යය නිදර්ශනාශ්‍රයෙන් විමර්ශනය කරන්න.

05. පහත දැක්වෙන කෙටිකතා අතරින් එකක් පිළිබඳ ව රස වින්දනාත්මක විචාරයක් සපයන්න.

1) වහල්ලු
2) තාත්තා
3) කරත්තය
4) යකඩ ගැහැණිය
5) දඬුලේනා

## III කොටස

06. "කොළඹ යුගයේ මුල් පරපුරට අයත් කවීහු කාලීන සමාජ අවශ්‍යතා පූරණය කිරීමේ අභිලාෂයෙන් ස්වකීය ප්‍රස්තුත තෝරාගැනීමට නැඹුරු වූහ." තත් මතයෙහි යුක්තියුක්තතාව සනිදර්ශන ව විභාග කරන්න.

07. පහත සඳහන් කවීන් අතරින් එක් අයෙකුගේ කාව්‍ය නිර්මාණවල වස්තු විෂයයක විශේෂතා පිළිබඳ ව විචාරයක් සපයන්න.

අ) පී.බී. සේනානායක
ආ) සිරිගුනසිංහ
ඇ) ගුණදාස අමරසේකර

08. සෙසු කලාමාධ්‍ය හා සංසන්දනයෙහි දී නාට්‍යකලාව වෙනස්වන ආකාරය නිදර්ශනාත්මක ව විභාග කරන්න.

09. මහාචාර්ය සරච්චන්ද්‍ර මනමේ නාට්‍ය නිර්මාණයෙහි දී මූලාශ්‍රය අතික්‍රමණය කිරීමට දැරූ පරිශ්‍රමය අගයන්න.

(සෑම පිළිතුරකටම ලකුණු 20 බැගිනි)

******************************